# වැව ආශ්‍රයෙන් ගොඩනැඟුණු ග්‍රාම නාමකරණයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී.එල්. හේරත් [1]

සාමූහික සත්ත්වයෙකු වූ මිනිසා පැවැත්මේ පහසුව සහ සුරක්ෂිත බව උදෙසා ජනාවාස වීම ආරම්භ කරන ලදි. එම ක්‍රියාවලියේදී ඔවුන් තම ජනාවාස සෙසු ජනාවාසයන්ගෙන් වෙන්කර දැක්වීම උදෙසා ජනාවාස නාමකරණය කිරීම අවශ්‍ය විය. ඒවා පිහිටි බිමෙහි භූගෝලීය සහ ජන සමාජයෙහි විශේෂතා සහ විෂමතා කරණ කොට නිර්මාණය විය. මෙය ලාංකේය ජන සමාජය වෙතත් බලපත්වන ලද කරුණක් වූ අතර මෙරට ප්‍රධාන ජනාවාස ආකෘතියක් වූ ලාංකේය ග්‍රාමයන්හි නම් වහර එවැන්නකි. එකී ලාංකේය ගම් නම් වහර උදෙසා වැව ආශ්‍රය වූයේ කෙසේ ද යන්න පිළිබඳ සොයා බැලීම පර්යේෂණයේ අරමුණ වේ. ඒ අනුව මෙම පර්යේෂණය උතුරුමැද සහ වයඹ යන පළාත්වල තෝරා ගත් ග්‍රාමයන් කිහිපයක ගැමියන්ගෙන් එකී ග්‍රාමයන්හි ගම් නම් වහර සම්බන්ධ ජනප්‍රවාද , ඓතිහාසික තොරතුරු ආදීය විමසා දැන ගැනීමෙනුත් ශ්‍රී ලංකේය ගම් නම් වහර පිළිබඳ වූ මූලාශ්‍රගත තොරතුරු අධ්‍යයන කිරීම යන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන ලදි. වැවක් මූලික කරගනිමින් නිර්මාණය වූ ග්‍රාමයන් ප්‍රධාන වශයෙන් ‘වාපි ගම්’ සහ ‘වැ ගම්’ නමින් හඳුන්වනු ලබයි. මේ සඳහා ‘පලිවාපිගම’ සහ ‘වැක’ යන ග්‍රාම නාමයන් උදාහරණයන් වේ. මෙකී ග්‍රාම නාම කාණ්ඩයේදී සුලබව දැකගත හැකි නම් විශේෂය නම් වැව යන පදය උපසර්ගානුකූල ව හෝ සන්ධි වීමකින් වෙනත් පදයක් හා එක් වී ගොඩනැඟුණු ‘මහව’, ‘ගල වැව’, ‘කුඩා වැව’ ආදි ග්‍රාම නාමයන්ය. තවද මේ පිළිබඳ විමර්ශනය කිරීමේදී තවත් ග්‍රාම නාම ආකෘති කීපයක් හමු වූ අතර ඒවා ‘කුඹ’, ‘කුලම’, ‘කුලුව’ සහ ‘කුලිය’ යන පද ආබද්ධයෙන් ගොඩනැඟුණු ග්‍රාම නාමයන්ය. මේ සඳහා ‘කුඹුක්කන්’, ‘මරදන්කුලිය’, ‘මදවක්කුලම’, ‘මොණ්ණෑකුලම’ යන ග්‍රාම නාම උදාහරණයන් වේ. මෙහිදි ‘කුලම’ යන්නෙන් නිර්මාණය වූ නාමයන් සඳහා දමිළ බසෙහි ආභාෂය ලැබී ඇත. එසේම වැව ආශ්‍රයෙන් සුසැදි ග්‍රාම නාමයන් පිළිබඳ මිථ්‍යා මතද වේ. එනම් ‘ලැව’ යන ‘ලැහැබ’ යන්නට සමාන අරුත් දෙන වචනය සන්ධි වීමෙන් ගොඩනැඟුණු ‘දිවුල්ලැව’, ‘මීවැල්ලැව’ ආදි ග්‍රාමනාමයන් උච්චාරණයේදී වැව යන්නට සමාන උච්චාරණයක් සිදුවන බැවින් එම නාමයන් වැවක් මූලික කරගනිමින් සිදු ව ඇතැයි යන විශ්වාසයයි. මෙම කරුණු සියල්ල දෙස බැලීමේදී ලාංකේය ගම් නම් වහර උදෙසා වැව මඟින් පැහැදිලි බලපෑමක් සිදු ව ඇති බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** ජනාවාසකරණය, ගම් නම් වහර, වැව, වියළි කලාපය, වාපි ගම්

[1] බෞද්ධ අධ්‍යයන සඳහා නාගානන්ද ජාත්‍යන්තර ආයතනය. buddhikalherath@gmail.com